ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර වැඩ සටහන

අවසාන පරීක්ෂණය - 2019/2020

**EPC1239/ESC1139 -** පෙර පාසල් සංවිධානය, නඩත්තුව හා කළමනාකරණය

කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2023.06.24 වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

---

පළමු කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, දෙවන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

**පළමු කොටස**

01. "පෙරපාසල් කළමනාකරණය" යන යෙදුම කෙටියෙන් පැහැදිලි කරන්න.

02. පෙරපාසලක සති සැලසුම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

03. පෙරපාසලක "පරිසර මුල්ලක" ඇති වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න.

04. ඔබගේ පෙරපාසල් දරුවන් ක්ෂේත්‍ර චාරිකා සඳහා රැගෙන යැමට අපේක්ෂා කරන ස්ථාන පහක් (05) නම් කරන්න.

05. පෙරපාසලක ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේ අරමුණු පහක් (05) ලියන්න.

06. ක්‍රියාකාරකම් සඳහා පෙරපාසල් ළමුන් කණ්ඩායම් කරන ආකාර පහක් (05) ලැයිස්තු ගත කරන්න.

07. පෙරපාසලක එළිමහන් සෙල්ලම් ක්‍රියාකාරකම් වල ඇති වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න.

08. පෙරපාසලක් ආරම්භ කිරීම සඳහා ස්ථානයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු පහක් (05) ලියන්න.

(ලකුණු 05 x 08 = 40)

<u>දෙවන කොටස</u>

09. i. පෙරපාසලක් කාර්යක්ෂම ව පවත්වා ගෙන යෑමේ දී ප්‍රජාවගේ භූමිකාවේ ඇති වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

ii. ශ්‍රී ලංකාවේ පෙරපාසල් අධ්‍යාපනය සම්බන්ධයෙන් රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවල කාර්යභාරය අගය කරන්න. (ලකුණු 10)

10. i. පෙරපාසලක වැඩ සැලසුම් කිරීම යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි විස්තර කරන්න. (ලකුණු 10)

ii. ඔබ පෙරපාසලක ක්‍රියාත්මක කරන දෛනික සැලැස්මක් ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

11. i. පෙරපාසල් ළමයින්ගේ අවශ්‍යතාවලට සරිලන ආරක්ෂාව සහ රැකවරණය ඇති පෙරපාසල් ගොඩනැගිල්ලක් සංවිධානය කරන අයුරු සාකච්ඡා කරන්න. (ලකුණු 10)

ii. ඔබ පෙරපාසල් ගොඩනැගිල්ල ඒ අන්දමින් සැලසුම් කලේ මක් නිසාදැයි විස්තර කරන්න. (ලකුණු 10)

12. i. පෙරපාසලක තක්සේරු කිරීමේ ක්‍රියාවලිය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.? (ලකුණු 08)

ii. පෙරපාසලක තක්සේරු කිරීමේ ක්‍රියාවලියක ඇති වැදගත්කම උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 12)

13. පහත සඳහන් ඒවායින් දෙකක් **(02)** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. පෙර පාසලක ළමයින් සඳහා අවශ්‍ය ලී බඩු

ii. පෙරපාසලක එළිමහන් ක්‍රියාකාරකම් සඳහා උපකරණ

iii. පෙරපාසල් දරුවන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම.

iv. ශ්‍රී ලංකාවේ දිවා සුරැකුම් මධ්‍යස්ථාන

(ලකුණු 10 x 02 = 20 යි.)

හිමිකම් ඇවිරිණි.